අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818 | info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/16/01/05/10-II වෙළුම

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2025.11.04

සියලු ම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප භාර නියෝජ්‍ය සහකාර /අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම රජයේ හා රජයේ අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන් වෙත

**නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට සමගාමී ව ප්‍රාථමික අධ්‍යාපන අංශයේ පාසල් කාල සටහන සකස් කිරීම - උපදෙස් ලිපිය.**

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ 2026 වර්ෂයේ සිට සාමාන්‍ය අධ්‍යාපන පද්ධතියට හඳුන්වාදීමට යෝජිත නව විෂයමාලා ප්‍රතිසංස්කරණ, 2026 වර්ෂයේ සිට ප්‍රාථමික අංශයේ පළමුවන ශ්‍රේණියටත් කනිෂ්ඨ ද්විතීයික අංශයේ 6 වන ශ්‍රේණියටත් ක්‍රියාත්මක කිරීමට නියමිත ය. ඒ අනුව 2026 වර්ෂයේ සිට ප්‍රාථමික අධ්‍යාපන අංශයේ පාසල් කාල සටහන සකස් කිරීමට අදාළ ව පහත උපදෙස් පිළිපදින ලෙස කාරුණික ව දන්වමි.

**1. ප්‍රාථමික පළමු ප්‍රධාන අවධිය (1 ශ්‍රේණිය) - නව විෂය නිර්දේශය**

2026 වසරේ සිට ඉදිරියට 1 ශ්‍රේණිය සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට කාලය වෙන්වන ආකාරය පහත පරිදි ය . පාසල් පවත්වන කාලය පෙ.ව. 7.30 සිට පෙ.ව. 11.45 දක්වා වේ.

| ඉගෙනුම් ක්ෂේත්‍ර | කාලය (සතියකට) |
|---|---|
| මව් බස | පැය 5 |
| ඉංග්‍රීසි භාෂාව | මිනිත්තු 50 (දිනකට මිනිත්තු 10 බැගින්) |
| දෙවන ජාතික භාෂාව | මිනිත්තු 30 |
| ගණිතය | පැය 3 මිනිත්තු 10 |
| ආගම හා සාරධර්ම අධ්‍යාපනය | පැය 1 මිනිත්තු 15 |
| මූලික විද්‍යාව සහ පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් | පැය 4 මිනිත්තු 35 |
| සෞන්දර්ය අධ්‍යාපනය | මිනිත්තු 50 |
| සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | මිනිත්තු 50 (දිනකට මිනිත්තු 10 බැගින්) |
| විෂය සමගාමී ක්‍රියාකාරකම් | මිනිත්තු 30 |
| උදෑසන රැස්වීම සහ ආගමික වතාවත් | පැය 1 මිනිත්තු 15 (දිනකට මිනිත්තු 15 බැගින්) |
| විවේක කාලය හා ආහාර ගැනීම | පැය 2 මිනිත්තු 30 (දිනකට මිනිත්තු 30 - පාසල් ආහාර වැඩසටහන සඳහා පෙ.ව. 7.30 - පෙ. ව. 8.30 අතර , මිනිත්තු 20ක් සහ විවේක කාලය සඳහා මිනිත්තු 10ක් බැගින්) |
| **සතියකට මුළු කාලය** | **පැය 21 මිනිත්තු 15** |

ගරු අමාත්‍යතුමිය / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832 | +94112784825 | minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary
+94112784811 | +94112785162 | secretary.education@moe.gov.lk

2. ප්‍රාථමික පළමු ප්‍රධාන අවධිය (2 ශ්‍රේණිය) - පැරණි විෂය නිර්දේශය

2026 වර්ෂයේ දී 2 ශ්‍රේණිය සඳහා පැරණි විෂය නිර්දේශය ම ක්‍රියාත්මක වන බැවින් දැනට ක්‍රියාත්මක කාලසටහනෙහි වෙනසක් සිදු නොවේ. එය පහත පරිදි ක්‍රියාත්මක වේ. පාසල් පවත්වන කාලය පෙ.ව. 7.30 සිට පෙ.ව. 11.45 දක්වා වේ.

| ඉගෙනුම් ක්ෂේත්‍ර | කාලය (සතියකට) |
|---|---|
| මව් බස | පැය 5 |
| දෙවන ජාතික භාෂාව | මිනිත්තු 30 |
| ගණිතය | පැය 3 මිනිත්තු 30 |
| ආගම | පැය 1 මිනිත්තු 15 |
| පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් | පැය 5 මිනිත්තු 30 |
| ශරීර සුවතා ක්‍රියාකාරකම් | පැය 1 මිනිත්තු 40 (දිනකට මිනිත්තු 20 බැගින්) |
| විෂය සමගාමී ක්‍රියාකාරකම් | මිනිත්තු 30(සතියේ එක් දිනක) |
| උදෑසන රැස්වීම සහ ආගමික වතාවත් | පැය 1 මිනිත්තු 15 (දිනකට මිනිත්තු 15 බැගින්) |
| විවේක කාලය | පැය 1 මිනිත්තු 15 (දිනකට මිනිත්තු 15 බැගින්) |
| ආහාර ගැනීම සඳහා | මිනිත්තු 50 (දිනකට මිනිත්තු 15 බැගින්) |
| **සතියකට මුළු කාලය** | **පැය 21 මිනිත්තු 15** |

**3. ප්‍රාථමික දෙවන ප්‍රධාන අවධිය (3 හා 4 ශ්‍රේණි) - පැරණි විෂය නිර්දේශය**

2026 වර්ෂයේ සිට 2027 වර්ෂය දක්වා 3 ශ්‍රේණිය සඳහා ද 2026 වර්ෂයේ සිට 2028 වර්ෂය දක්වා 4 ශ්‍රේණිය සඳහා ද පැරණි විෂය නිර්දේශය ක්‍රියාත්මක වේ. පාසල් පවත්වන කාලය පෙ.ව 7.30 සිට ප.ව 1.00 දක්වා වේ.

| ඉගෙනුම් ක්ෂේත්‍ර | කාලය (සතියකට) |
|---|---|
| මව් බස | පැය 5 |
| ගණිතය | පැය 5 |
| පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් | පැය 5 මිනිත්තු 40 |
| ඉංග්‍රීසි | පැය 3 මිනිත්තු 20 |
| ආගම | පැය 2 |
| දෙවන ජාතික භාෂාව | පැය 1 |
| උදෑසන රැස්වීම හා ආගමික වතාවත් | පැය 1 මිනිත්තු 15 (දිනකට මිනිත්තු 15 බැගින්) |
| විවේකය | පැය 2 මිනිත්තු 05 (දිනකට මිනිත්තු 25 - පාසල් ආහාර වැඩසටහන සඳහා පෙ.ව.7.30-8.30 අතර මිනිත්තු 15ක් සහ විවේක කාලය සඳහා මිනිත්තු 10ක් බැගින්) |
| ශාරීරික සුවතා ක්‍රියාකාරකම් | පැය 1 මිනිත්තු 40 (දිනකට මිනිත්තු 20 බැගින්) |
| විෂය සමගාමී ක්‍රියාකාරකම් | මිනිත්තු 30 |
| **සතියකට මුළු කාලය** | **පැය 27 මිනිත්තු 30** |

**4. ප්‍රාථමික තෙවන ප්‍රධාන අවධිය (5 ශ්‍රේණිය) - පැරණි විෂය නිර්දේශය**

2026 වර්ෂයේ සිට 2029 වර්ෂය දක්වා පැරණි විෂය නිර්දේශය යටතේ 5 ශ්‍රේණිය (ප්‍රාථමික තෙවන ප්‍රධාන අවධිය) සඳහා පෙ.ව.7.30 සිට ප.ව.2.00 දක්වා පාසල පැවැත්වේ. ඒ අනුව පහ ශ්‍රේණිය සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදුකළ යුතු ආකාරය පහත දක්වා ඇත.

| ඉගෙනුම් ක්ෂේත්‍ර | කාලය (සතියකට පැය) |
|---|---|
| මව්බස | පැය 5 මිනිත්තු 25 |
| ගණිතය | පැය 5 මිනිත්තු 25 |
| පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් | පැය 7 මිනිත්තු 30 |
| ඉංග්‍රීසි | පැය 3 මිනිත්තු 20 |
| දෙවන ජාතික භාෂාව | පැය 1 |
| ආගම | පැය 2 |
| උදෑසන රැස්වීම හා ආගමික වතාවත් | පැය 1 මිනිත්තු 15 (දිනකට මිනිත්තු 15 බැගින්) |
| විවේකය | පැය 2 මිනිත්තු 05 (දිනකට මිනිත්තු 25 -පාසල් ආහාර වැඩසටහන සඳහා පෙ.ව.7.30 - පෙ.ව. 8.30 අතර මිනිත්තු 15ක් සහ විවේක කාලය සඳහා මිනිත්තු 10 ක් බැගින්) |
| ශාරීරික සුවතා ක්‍රියාකාරකම් | පැය 2 මිනිත්තු 30 (දිනකට මිනිත්තු 30 බැගින්) |
| විෂය සමගාමී ක්‍රියාකාරකම් | පැය 1 මිනිත්තු 10 |
| වෛකල්පිත ක්‍රියාකාරකම් | මිනිත්තු 50 |
| **සතියකට මුළු කාලය** | **පැය 32 මිනිත්තු 30** |

ඒ අනුව නව අධ්‍යාපනයේ පරිවර්තනීය වෙනස සාර්ථක ව පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා සියලු දෙනාගේ ම සක්‍රිය දායකත්වය සහ සහයෝගය අපේක්ෂා කරමි. ප්‍රාථමික අංශය සහිත ද්විතියික පාසල්වල, ප්‍රාථමික ඉංග්‍රීසි විෂය සඳහා ගුරුවරුන් යොදවා ගැනීමේ දී ද්විතීයික අංශයේ ඉගෙනුම් කටයුතුවලට බාධාවක් නොවන ලෙස යෝග්‍ය පරිදි ගුරුවරුන් උපයෝජනය කිරීම විදුහල්පතිවරුන්ගේ වගකීමයි.

5. පොදු කරුණු:-

I. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ විෂය ඉගැන්වීමේ දී විෂය නිර්දේශවල සඳහන් උපදෙස්වලට අනුකූල වන පරිදි පාසල්වල ඉගැන්වීම් කටයුතු සංවිධානය කිරීමට විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

II. මෙම නව විෂය නිර්දේශයට අදාළව ජාතික අධ්‍යාපන ආයතනය විසින් සම්පාදිත ක්‍රියාකාරකම් පොත් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණය කර අදාළ නියමිත කාලය තුළ දී පාසල්වලට ලබා දීමට කටයුතු කරනු ලැබේ.

III. මෙම උපදෙස් පත්‍රිකාවේ විධිවිධාන සම්බන්ධයෙන් මතුවන ඕනෑම ගැටලුවක් පිළිබඳව අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

IV. මෙම උපදෙස් පත්‍රිකාවේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

නාලක කළුවැව
ලේකම්

පිටපත්-:

1. සියලු ම පළාත් ආණ්ඩුකාර ලේකම්වරුන්
2. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති
3. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
4. විභාග කොමසාරිස් ජනරාල්
5. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
6. අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ම අතිරේක ලේකම්වරුන්, අනෙකුත් මාණ්ඩලික නිලධාරීන් හා ශාඛා ප්‍රධානීන්